// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2377/41 - 2024 මාර්තු මස 28 වැනි බ්‍රහස්පතින්දා - 2024.03.28
(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත**

3 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ වූ නියමය

සංශෝධිත 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනතේ 3 (4) වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මෙම නියමය මගින් ඉහත පනතේ අරමුණු සඳහා, මඩකලපුව දිස්ත්‍රික්කයේ එරාවූර් ප්‍රදේශයේ ස්ථාපිත "විශේෂිත රෙදිපිළි නිෂ්පාදන කලාපය" (මෙහි මින් මතු ''කලාපය" යනුවෙන් සඳහන් කරනු ලබන), ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස එම කලාපය ප්‍රකාශයට පත්කිරීම සහ ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති විෂය පථයට අයත් වන සහ කලාපය තුළ ස්ථාපිත ව්‍යාපෘති ලෙස හඳුනාගෙන ඇති තනි ව්‍යවසායයන් සඳහා දිරි ගැන්වීම් ලබා දීම සඳහා ප්‍රකාශිත, 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙහි* පළකරන ලද නියමයන්, පැහැදිලි කොට මෙයින් ප්‍රකාශ කරමි;

(1) 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (3) වගන්තිය මෙහිලා පහත සඳහන් ඡේදය මගින් ආදේශ කරමි:

"ඉහත කී ව්‍යාපෘතියේ කාර්යයන් සඳහා ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත ප්‍රකාරව, මෙම නියමයේ පහත සඳහන් I වන උපලේඛනයේ දක්වා ඇති යෝජිත නිදහස් කිරීම් මෙමගින් හඳුනාගනු ලැබූ ඇති ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති විෂය පථයට අයත්වන සහ කලාපය තුළ ස්ථාපිත ව්‍යවසායයන් ලෙස BOI විසින් හඳුනාගෙන ඇති තනි ව්‍යවසායයන් සඳහා අදාළ විය යුතුය."

(2) 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (5) වගන්තිය මෙහිලා පහත සඳහන් ඡේදය මගින් ආදේශ කරමි:

"BOI විසින් එක් එක් ව්‍යවසායයන් සඳහා දිරි ගැන්වීම් ලබාදෙනු ඇති අතර එම දිරි ගැන්වීම් BOl සහ ව්‍යවසායය අතර එළැඹෙන ගිවිසුම (මෙහි මින්මතු "BOI ගිවිසුම" ලෙස හඳුන්වනු ලබන) තුළ සඳහන් කෙරෙනු ඇත.

එම BOI ගිවිසුමට එළැඹීමෙන් අනතුරුව, ව්‍යවසායයේ නම, ව්‍යවසායයේ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය, පැහැදිලි කරන ලද 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ I වන උපලේඛනය ප්‍රකාර අදාළ තනි ව්‍යවසායයට ලබා දී ඇති පූර්ණ හෝ පාර්ශ්වීය බදු නිදහස්කරණයන් ආරම්භවන හා අවසන්වන දිනයන්, ආයෝජන ප්‍රවර්ධන විෂය භාර අමාත්‍යවරයා විසින් පළ කරනු ලබන ගැසට් නිවේදනයක් මගින් පැහැදිලි කරන ලද 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ II වන උපලේඛනය තුළට ඇතුළත් කර පාර්ලිමේන්තුවේ සභාගත කෙරෙනු ඇත."

1A - G 41678 — 05 (2024/03)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

(3) 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ (5) වන වගන්තියට ඉක්බිතිවම, එහි උපලේඛනය "I වන උපලේඛනය" ලෙස නැවත නම් කිරීම

(4) 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනයේ (2) අයිතමය මෙහිලා පහත පරිදි පැහැදිලි කරනු ලැබේ:

(2) අයිතමයේ i අනු-අයිතමයෙන් ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් ඃ

"2002 අංක 14 දරන එකතුකළ අගය මත බදු පනත හා එහි සංශෝධන යටතේ ව්‍යවසායය මෙහි I වන උපලේඛනයේ (6) අයිතමය තුළ දක්වා ඇති කාල සීමාවක් සඳහා එකතු කළ අගය මත බදු ගාස්තු ගෙවීමෙන් නිදහස් කෙරෙනු ඇති අතර, පහත සඳහන් අනු-අයිතමය ii සහ අනු-අයිතමය iii සඳහා එකී බදු නිදහස් කාල සීමාව, ව්‍යවසායය BOI සමග ගිවිසුමට එළැඹි දින සිට ආරම්භ විය යුතුය".

(5) 2021 ජූලි 30 දිනැති අංක 2238/40 *දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනයේ (3) අයිතමය මෙහිලා පහත පරිදි පැහැදිලි කරනු ලැබේ:

(3) අයිතමයේ i අනු-අයිතමයෙන් ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන්ඃ

"මෙහි I වන උපලේඛනයේ (6) අයිතමය තුළ පනවා ඇති කාල පරිච්ඡේදයක් සඳහා 2011 අංක 18 දරන වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු පනත හා එහි සංශෝධන යටතේ වරාය හා ගුවන් තොටුපොළ සංවර්ධන බදු ගෙවීමෙන් හා අය කිරීමෙන් ව්‍යවසායය නිදහස් විය යුතු අතර, පහත සඳහන් අනු-අයිතමය ii සහ අනු-අයිතමය iii සඳහා එකී බදු නිදහස් කාල සීමාව, ව්‍යවසායය BOI සමග ගිවිසුමට එළැඹි දින සිට ආරම්භ විය යුතුයඃ"

(6) 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනයේ (4) අයිතමය මෙහිලා පහත පරිදි පැහැදිලි කරනු ලැබේ:

(4) අයිතමයේ i අනු-අයිතමයෙන් ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් ඃ

"මෙහි I වන උපලේඛනයේ (6) අයිතමය තුළ පනවා ඇති කාල පරිච්ඡේදයක් සඳහා (235 වන අධිකාරය වූ) රේගු ආඥාපනත හා එහි සංශෝධන යටතේ ආනයන රේගු බදු ගෙවීමෙන් හා අය කිරීමෙන් ව්‍යවසායය නිදහස් විය යුතු අතර, පහත සඳහන් අනු-අයිතමය ii සහ අනු-අයිතමය iii සඳහා එකී බදු නිදහස් කාල සීමාව, ව්‍යවසායය BOI සමග ගිවිසුමට එළැඹි දින සිට ආරම්භ විය යුතුය".

(7) 2021 ජූලි 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* උපලේඛනයේ (5) අයිතමය මෙහිලා පහත පරිදි පැහැදිලි කරනු ලැබේ:

(5) අයිතමයේ i අනු-අයිතමයෙන් ඉක්බිතිවම පහත සඳහන් ඡේදය ඇතුළත් කිරීමෙන් ඃ

"මෙහි I වන උපලේඛනයේ (6) අයිතමය තුළ පනවා ඇති කාල පරිච්ඡේදයක් සඳහා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත හා එහි සංශෝධන යටතේ වෙළඳ භාණ්ඩ අපනයන සහන යෝජනාක්‍රම බදු (CESS බදු) ගෙවීමෙන් හා අය කිරීමෙන් ව්‍යවසායය නිදහස් විය යුතු අතර, පහත සඳහන් අනු-අයිතමය ii සහ අනු-අයිතමය iii සඳහා එකී බදු නිදහස් කාල සීමාව, ව්‍යවසායය BOI සමග ගිවිසුමට එළැඹි දින සිට ආරම්භ විය යුතුය".

(8) උපලේඛනයේ (2) අයිතමය, (3) අයිතමය, (4) අයිතමය සහ (5) අයිතමය යටතේ බදු නිදහස් කිරීමට අදාළ කාල සීමාව පිළිබඳව 2021 ජූලි මස 30 දිනැති අංක 2238/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* (5) වගන්තියට ඉක්බිතිවම (6) අයිතමය වශයෙන් නව අයිතමයක් ඇතුළත් කිරීමෙන් තවදුරටත් පැහැදිලි කෙරේ.

**"(6) (2) අයිතමය, (3) අයිතමය, (4) අයිතමය සහ (5) අයිතමය යටතේ බදු නිදහස් කිරීමට අදාළ කාල සීමාව ඃ**

I වන උපලේඛනයේ (2), (3), (4) සහ (5) යන අයිතමයන් මගින් යොමුගත ප්‍රඥප්ති විධිවිධාන යටතේ, එම අයිතමයන් හි අනු-අයිතම් අංක ii සහ iiiට අදාළ බදු නිදහස් කාල සීමාවන් පිළිවෙලින් මෙහි එන වගුවෙහි I වන තීරුව, II වන තීරුව, III වන තීරුව සහ IV වන තීරුව තුළ පනවා ඇත.

| | | I තීරුව VAT | II තීරුව PAL | III තීරුව CID | VI තීරුව CESS |
|---|---|---|---|---|---|
| 10ට වැඩි හෝ සමාන සහ 15ට අඩු (≥ 10,<15) | 150 | 5 | 5 | 5 | 5 |
| 15ට වැඩි හෝ සමාන සහ 20ට අඩු (≥ 15,<20) | 200 | 7 | 7 | 7 | 7 |
| 20ට වැඩි හෝ සමාන සහ 25ට අඩු (≥ 20,<25) | 300 | 8 | 8 | 8 | 8 |
| 25ට වැඩි හෝ සමාන සහ 30ට අඩු (≥ 25,<30) | 350 | 9 | 9 | 9 | 9 |
| 30ට වැඩි හෝ සමාන සහ 40ට අඩු (≥ 30,<40) | 400 | 10 | 10 | 10 | 10 |
| 40ට වැඩි හෝ සමාන සහ 50ට අඩු (≥ 40,<50) | 600 | 12 | 12 | 12 | 12 |
| 50ට වැඩි හෝ සමාන සහ 70ට අඩු (≥ 50,<70) | 700 | 15 | 15 | 15 | 15 |
| 70ට වැඩි හෝ සමාන සහ 100ට අඩු (≥ 70,<100) | 1,000 | 18 | 18 | 18 | 18 |
| 100ට වැඩි හෝ සමාන සහ 200ට අඩු (≥ 100,<200) | 1,400 | 20 | 20 | 20 | 20 |
| 200ට වැඩි හෝ සමාන (≥ 200) | 2,800 | 25 | 25 | 25 | 25 |

"

(9) පහත සඳහන් පරිදි නැවත නම් කරන ලද I වන උපලේඛනයේ (6) අයිතමයෙන් ඉක්බිතිවම II වන උපලේඛනය ලෙස නව අයිතමයක් ඇතුළත් කිරීමෙන්:

"**II වන උපලේඛනය**

5 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි, කලාපය තුළ පිහිටුවා ඇති හා BOI විසින් ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති විෂය පථය තුළට ගැනෙන බවට හඳුනාගනු ලැබ ඇත්තා වූද මෙහි 1 වන වගුව තුළ දක්වා ඇති සුදුසුකම් ලැබීමේ නිර්ණායක සපුරාලීමට යටත්ව BOI සමග ගිවිසුමකට එළැඹ ඇති තනි ව්‍යවසායයන්, මෙහි 2 වන වගුවෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි, I වන උපලේඛනයෙහි ඇති ප්‍රඥප්ති විධිවිධානවලින් නිදහස් කෙරෙනු ඇත.

1 වන වගුව : කලාපය තුළ පිහිටුවා ඇති ව්‍යවසායන් පිළිබඳ විස්තර

| අනු අංකය | ගැසට් නිවේදනයේ අංකය හා දිනය | ව්‍යවසායයේ නම | BOI සමග ගිවිසුම් ගත දිනය | ව්‍යාපෘතියේ ස්වභාවය | සුදුසුකම් ලැබීමේ නිර්ණායක | ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව | ව්‍යාපෘතිය වාණිජ මෙහෙයුම් කටයුතු ආරම්භ කරනු ලබන දිනය |
|---|---|---|---|---|---|---|---|
| 1 | | | | | | | |
| | | | | | | | |
| | | | | | | | |

**2 වන වගුව :** ඉහත 1 වන වගුව තුළ හඳුනාගනු ලැබූ ව්‍යවසායන් සඳහා ලබාදී ඇති දිරිගැන්වීම් පිළිබඳ විස්තර :

| අනු අංකය | ව්‍යවසායයේ නම | බදු නිදහස් කාල සීමාව | | | | | | සේවා නියුක්තිය මත ආදායම් බදු නිදහස්කරණය | ආනයන ගාස්තු නිදහස්කරණය (VAT[3]/PAL[4]/ CID[4]/CESS[4]) | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | සමාගමේ ආදායම් බදු නිදහස්කරණය | | | අපනයනකරුවන් සඳහා එවකට පවතින සමාගම් ආදායම් බදු අනුපාතයෙන් 50% ක සහනය ලැබෙන කාලය (වසර ගණන) | | | | ඉදිකිරීම් ආශ්‍රිත භාණ්ඩ | | | ප්‍රාග්ධන භාණ්ඩ (පිරියත, යන්ත්‍ර, උපකරණ)[5] | | | අමුද්‍රව්‍ය සහ නිෂ්පාදන/ක්‍රියාවලි ආශ්‍රිත පාරිභෝගික භාණ්ඩ | | |
| | | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන්වන දිනය | වසර ගණන | ආරම්භක දිනය | අවසන් දිනය |
| 1 | | | | | | | | | | | | | | | | | |
| | | | | | | | | | | | | | | | | | |
"

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 මාර්තු මස 21 වැනි දින,
කොළඹ දී ය.

---

[1] සමාගම් ආදායම් බදු නිදහස් කාල සීමාව හා සහන කාලය අවසන් වීමෙන් අනතුරුව;

i. අපනයන වශයෙන් සලකනු ලබන භාණ්ඩ ද ඇතුළත්ව, අපනයනයන් හරහා ජනනය කරනු ලබන ආදායම් වෙනුවෙන්, එම කාලයෙහි පවතින අපනයනකරුවන් හට බලපාන්නා වූ සමාගම් ආදායම් බදු අනුපාතය අදාළ වනු ඇත.

ii. දේශීය වෙළඳපල වෙත ආනයන ආදේශනයක් ලෙස අලෙවි කිරීම හරහා ජනනය කරනු ලබන ආදායම වෙනුවෙන්, එම කාලය තුළ නිෂ්පාදකයන් වෙත අදාළ වන්නා වූ සමාගම් ආදායම් බදු අනුපාතය අදාළ වනු ඇත.

[2] ආදායම් බදු නිදහස්කරණය ගණනය කිරීමේ දී, කලාපය තුළ පවත්නා ව්‍යවසායේ විදේශීය සේවා නියුක්තිකයන්, සේවා නියුක්තිය තුළින් ලබන ප්‍රතිලාභ හා ලාභ තුළින් ඉස්මතුවන ආදායම් පමණක්, බද්දෙන් නිදහස් විය යුතුය.

[3] බන්ධිත ප්‍රදේශවලින් (රේගු දෙපාර්තමේන්තුව හෝ BOI) මිලදී ගැනීම් සහ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් විසින් පාලනය කරනු ලබන එකතු කළ අගය මත බදු පාලන ක්‍රමය (උදා: SVAT) තුළ ලියාපදිංචි වී ඇති ඕනෑම ලියාපදිංචි පුද්ගලයෙකු වෙතින් ලැබෙන සැපයුම් ද ඇතුළත්ව, ව්‍යාපාරය වෙත සිදු කෙරෙන සියලු ආනයන මත

[4] බන්ධිත ප්‍රදේශවලින් (රේගු දෙපාර්තමේන්තුව හෝ BOI) සිදු කරන මිලදී ගැනීම් ද ඇතුළත් සියලු ආනයන මත

[5] අපනයන වශයෙන් සලකනු ලබන භාණ්ඩද ඇතුළත්ව අපනයනය සඳහා නිපදවනු ලබන භාණ්ඩ හා දේශීය වෙළඳපල වෙත ආනයන ආදේශනයක් ලෙස අලෙවි කිරීම සඳහා නිපදවනු ලබන භාණ්ඩ යන දෙඅංශයේම පරිහරණය පිණිස.

EOG 03-0225

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.